## ඇසට කඳුළක් නංවන පිදුමක්



මාසයක සංචාරයකින් පස්සෙ රත්න ශ්‍රී විජේසිංහ කවියා මේ සටහන ලියන අද ආපසු ලංකාවට පිටත්ව ගියා. මේ හෘදයංගම මිනිසා වෙනුවෙන් ඊයේ (31) සවස්භාගයේ අපේ හිතවතකුගේ නිවසේ පැවති සුහද සාදයකදී අපේ හිතවතා විසින් සිදු කරන ලද අපූරු පූජාවක් මගේ සිතේ තැන්පත් වුණා.

ඔහු රත්න ශ්‍රී ඉදිරියට ආවෙ අට පිරිකරක් අතේ ඇතිව. අපේ කවියා රත්න ශ්‍රී පුදුමයෙන් වගේ බලා හිටියා.

"මේකට අත ගහන්න සර්" යාලුවා කිව්වා. "මං සර් ගියාට පස්සෙ මේ අට පිරිකර පන්සලකට පූජා කරනවා. සර්ටත් සර්ගේ මේ සංචාරයට මුල් වෙච්ච නිරාශ දිලිණි සුමින්ද කියන තුන්දෙනාටත් උදව් උපකාර කළ අනිත් සියළුම දෙනාටත් යහපතක්ම වෙන්න කියලා"
රත්න ශ්‍රී ගේ ඇස්වල කඳුළක් නැවිලා තිබුණා කියලයි එතැන හිටපු අපේ හිතවතෙක් කිව්වෙ.

අපේ සමාජය කොයි තරම් සුන්දර තැනක්ද කියලා මොහොතකට හරි අපට වැටහෙන්නෙ මේ වගේ පුවත් අහනකොටයි. කොයි තරම් හෘදයංගම මිනිසුන් අපි අතර ඉන්නවද? කොයි තරම් මිනස්කම් පිරුණ හිත් ඇති මිනි සුන් අප අතර ඉන්නවද? ක්‍රෝධයෙන් වෛරයෙන් සිත් දූෂ්‍ය කරගත්තු මිනිසුන් අතර මේ වගේ සුන්දර අදහස් ඇති මිනිසුන් කොයි තරම් කැපී පේනවද?

රත්න ශ්‍රී ට මේ අපූරු පූජාව කළ කලාකරුවාගේ නම සහන් වීරසේකර යි

*(සේයාරුව නිරාශ ගුණසේකරගේ වත් පොතින් උපුටාගන්නා ලද්දකි)*

## දරුවකුගේ අනාගත සිහිනය?



"මගේ අනාගත සිහිනය" මාතෘකාවෙන් චිත්‍රයක් අඳින්නැයි ශ්‍රී ලංකාවේ පාසලක දරුවන්ගෙන් ඉල්ලා සිටිය විටෙකදී එක් දරුවකු ඇඳි චිත්‍රයයි මේ. චිත්‍රයේ සිටින්නේ ගිණි අවියකින් තවත් පුද්ගලයකුට වෙඩි තබන මිනිසෙකි. හමුදා භටයකු වන්නටත් ඉඩ ඇත. එසේ නොවන්නටත් ඉඩ ඇත. වෙඩි පහර ලබන්නේ තවත් මිනිසෙකි. වර්ණ ඡායාරූපයේ ඩේ පහර ලබන්නාගේ සිරුරින් විසිවන රුධිරය රතු පැහැයෙන් දක්වා තිබුණි.

මේ චිත්‍රය පිළිබිඹු කරන්නේ අපේ රටේ දරුවන්ගේ සිත් කොයි තරම් දූෂණයට පත්ව තිබේද යන කාරණයයි. මිනිසකුට වෙඩි තබා මැරීම චිත්‍රණය කරන්නට නම් මනසක් කොයි තරම් සාහසික මට්ටමකට වැටී තිබිය යුතුද යන්න තේරුම් ගැනීමට අති විශාල තර්ක විතර්ක අවශ්‍ය නැත.

උදේ හවා මිනීමරුම් උත්කර්ශයට නංවන රටක දරුවන් මේ තත්වයට ඇද වැටීම පුදුමයක් නොවේ. මිනිසකු මරා දැමීම මදුරුවකු මරා දැමීම තරම් සරළ කාරණයක් ලෙස සිතන්නට අපේ දරුවන් පෙළැඹී ඇත්තේ ඇයිද යන්න නැවත නැවතත් කල්පනා කළ යුතුය. දැන් වත් හමුදා මානසිකත්වයෙන් තොර රටක් බිහි කරන්නට වෙර දැරිය යුතුය.

උදේ හවා බණ කීමෙන් පමණක් සියල්ල යහපත් වන්නේ නැත. සිදුවිය යුත්තේ වඩා ධණාත්මක බුද්ධි පරිවර්තනයකි. වඩා යහපත් දේ කෙරෙහි දරුවන්ගේ මනස යොමු කරන්නට වැඩිහිටි පරපුර උත්සාහ කළ යුතුය.

පසුගිය දා මෙල්බන්හි සංචාරය කළ රත්න ශ්‍රී විජේසිහ කවියා සිය දෙසුම් වලදී කීවාක් මෙන් දරුවන්ගේ මනස කලාව දෙසට යොමු කිරීමෙන් මේ විනාශය යම් තරමක් දුරට හෝ වළක්වා ගත හැකි වනු ඇත. කලාව භාවණාවකි. ඒ භාවණාවේ ගැලෙන්නන් අතින් මෙවන් සාහසික දේ නිර්මාණය වන්නේ නැත.

ඔබේ දරුවා අතට සෙල්ලම් පිස්තෝලයක් වෙනුවට සෙල්ලම් තුවක්කුවක් වෙනුවට පොතක් දෙන්න. ඒ පොතේ අකුරු ඔබේ දරුවා අපරාධකරුවකු නොකර බුද්ධිමතකු කරනු ඇත.

අප තවත් ප්‍රමාද විය යුතු නැතැයි මම සිතමි. යහපත් හෙටක් දකින්නට නම් යහපත් දරු පරපුරක් අපට සිටිය යුතුය.

## කතාබහ

**ජගත් ජේ එදිරිසිංහ**

### කතිකා

මෙල්බන් නගරයේ ජීවත්වන නිර්මාණකරණයේ යෙදෙන සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන අයගේ එකමුතුවක් ගොඩ නැගිය යුතුය කියන අදහසින් ආරම්භ කෙරුණ "කතිකා" වැඩ සටහනේ තුන්වන පියවරට සහභාගිවෙන්න ලැබුණ අවස්ථාව ගැන සතුටුයි.

ඒ කාරණා කීපයක් නිසයි. පළමුවන කාරණාව තමන් යෙදී සිටින නිර්මාණ ක්ෂෙත්‍රය පිළිබඳ ප්‍රවීණයන්ගේ අදහස් දැනගැනීම සහ ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීම ට හැකිවීම. හුදකලාවේ සිට නිර්මාණකරණයේ යෙදෙන නිර්මාණකරුවන්ට තමන් සිටිනා තැන පිළිබඳ තක්සේරුවක් කරගන්නට මේක ඉතා හොඳ අවස්ථාවක්.

මේ කාරණයේ තිබෙන වැදගත් කම වැඩියෙන්ම දැනෙන්නෙ පුවත්පත් වලට සම්බන්ධව සිටින අපටයි. අපට ලැබෙන නිර්මාණ කියවන විට මේ




සමහර නිර්මාණකරුවනට නිර්මාණකාරියනට නිසි මග පෙන්වීමක් නැති බව පෙනී යන අවස්ථා එමටයි. දක්ෂ නිර්මාණකරුවන් වීමේ ශක්‍යතාව ඇති නමුත් නිසි මගපෙන්වීමක් හෝ නිසි අධ්‍යයනයක් නැති කමින් අතර මග නැවතුණ නිර්මාණකරුවන් රැසක් අපි දන්නවා. සතත අභ්‍යාසය කියන කාරණයත් තමන් නිරත වෙලා ඉන්න කලා ක්ෂෙත්‍රය පිළිබඳ අධ්‍යයනයත් කියන දෙකම නිර්මාණකරණයේ යෙදෙන අයට වැදගත්. කතිකා වැඩ සටහනින් මේ සඳහා විශාල පෙළඹවීමක් ඇති කෙරෙන බව අපට පේනවා. අනෙක් අතින් නිර්මාණකරුවකුට සමාජයෙන් වියුත්ක වෙලා හුදකලාව සිටීමේ හැකියාවක් අද දවසේ නැහැ. ඔවුන්ට සිදුවෙනවා සමාජය සමග ගැටෙමින් සංවා දයක යෙදෙන්නට. අදහස් හුවමාරු කරගන්නට. එකිනෙකාගේ නිර්මාණ රස විඳ ගන්නට. ඒවා පිළිබඳ විශ්ලේෂණයක යෙදෙන්නට.

වැදගත්ම දෙය තමයි සමාජය ගමන්ගේ නිර්මාණයට දෙන අර්ථ දැක්වීම කුමක්ද කියන දෙය කෙරෙහි උපේක්ෂාවෙන් බලා සිටින්නට ඉගෙනගැනීම.

පසුගිය වැඩ සටහන් තුනටම සහභාගි වූ විද්වතුන් පකීපදෙනාම ඒ ඒ ක්ෂෙත්‍රවල විශිෂ්ඨයින්. ජයතිලක කම්මැල්ලවීර රත්න ශ්‍රී විජේසිංහ ධර්මසේන පතිරාජ වගේ වියතුන්ගෙන් අපට ලබා ගන්න තිබෙන දැනුම ඉතා පුළුල් වපසරියක විසිරිලා යන්නක්.

ඒ වගේම සහභාගිවෙලා හිටිය පිරිසගේ උනන්දුවත් විශේෂයෙන්ම කැපී පෙනුණා. ඒක සතුටක්. කතිකා වැඩ සටහන ඉදිරියටම ගෙන යන්නට හැකිවේවායි එය සංවිධානය කරන වරුණ සාවින්ද ඇතුළු පිරිසට සුබ පතන්නේ මෙල්බන් පුරවරයේ ලියන පරපුරට දැඩි ලෙස ආදරය කරන මිනිසෙකු ලෙසයි.

එක්ව ඉදිරියට යමු කියන තැන තමයි මං ඉන්නෙ. පෙබරවාරි 20 ආයෙ එකතුවෙමු

## නිරාශ ගුණසේකරගේ "සුදු කතක් හා මධු විතක්" කාව්‍ය සංග්‍රහය එළිදැක්වුණ දා

